# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පෙරවදනක්

CPA
Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පෙරවදනක්

නීතිඥ එස්. ජී. පුංචිහේවා

C P A
Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පෙරවදනක්**

ප්‍රථම මුද්‍රණය : **සැප්තැම්බර් 2015**

ISBN : 978-955-4746-41-1

පරිගණක සැකැස්ම : **වාක්‍යා රූ දු.ඇ. 011-2708377**

මුද්‍රණය **: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දු.ඇ. 011-2329739**

ප්‍රකාශනය **: විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

| | | |
|---|---|---|
| ලිපිනය | : | 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05. |
| දුරකථන | : | 011 2370803 / 4 |
| ෆැක්ස් | : | 011 2370801 / 2 |
| වෙබ් අඩවිය | : | www.cpalanka.org |
| ඊමේල් | : | info@cpalanka.org |

## පෙර වදන

ඉදිරි කාලයේ ශ්‍රී ලංකාවට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති වන්නේ නම්, ඊට උපයෝගී කරගත හැකි අදහස් ටිකක් මේ කුඩා පොතින් දක්වේ.

මෙම අදහස් විශේෂයෙන් දකුණු අප්‍රිකාවේ සහ කෙන්යාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඇසුරෙන් ගොනු කැරිණි.

මෙය පුරවැසියන්ගේ පරිශීලනය සඳහා වඩා යෝග්‍යයයි සිතමු.

**එස්. ජී. පුංචිහේවා**

01.10.2015

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක්ද?

**එය නීතියකි. සාමාන්‍ය නීතියක් නොව රටේ ඉහළ ම නීතියයි. අනෙක් සියලුම නීති රීති ක්‍රියාත්මක විය යුත්තේ එම ඉහළම නීතියට යටත්ව ය. ඊට ඉහළින් ක්‍රියාත්මක වන කිසිම නීතියක් එම රටේ මෙන් ම, එහි ප්‍රදේශයක, ආයතනයක හෝ ගෙදරක භාවිත නොවිය යුතු ය. ගමේ මරණාධාර සමිතියක හෝ ක්‍රීඩා සමිතියක හෝ රටේ ඉහළ ම නීතිය ඉක්මවා යන ව්‍යවස්ථා පැනවිය නො හැකි ය.**

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදිය යුත්තෝ කවුරුද?

**ආණ්ඩුව, ජනාධිපති, අගමැති ඇතුළුව සියලු ජනයා විසින් ම පිළිපැදිය යුතු ය. එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉහළින් කිසිම පුද්ගලයකු නොසිටිය යුතු ය.**

ආණ්ඩුව සැදී තිබිය යුතු ආකාරයත්, ඇමතිවරුන්, නිලධරයන් විසින් එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලතලත් එහි සඳහන්

වේ. එවිට එම බලතල ඉක්මවා හිතුවක්කාර ලෙස ක්‍රියා කිරීම වැළැක්වීමේ නීති ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් විය යුතු ය. එසේ ක්‍රියා කිරීම වැළැක්වීමට නම් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ද, එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ප්‍රතිකර්ම ලබා ගැනීමේ ආයතන ද ව්‍යවස්ථාවේ සඳහන් විය යුතු ය. එම ආයතන ස්වාධීන හෙවත් මැති ඇමතිවරුන් යටතේ නොපැවතිය යුතු ය. එසේ ම ආයතනවල පාලක නිලධරයන් ඊට නිසි දැන උගත්කම් සහ පළපුරුදුකම් ඇති, කොන්ද කෙළින් තබාගෙන ක්‍රියා කරන අය විය යුතු ය.

අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, රජයේ කාර්යාල ආදියට අදාළ වන වැඩ කටයුතු ගැන වෙනම නීති රීති පනවා ගැනේ. එම රීති සියල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව එම ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන පරිදි පනවා ගත යුතු ය. මේ අතර අමාත්‍යාංශයන් ගේ එක් එක් දෙපාර්තමේන්තුවලට අයිති විෂයයන් ගැන වරින් වර සාමාන්‍ය නීති පනවා ගැනේ. ඒවා පනත් වශයෙන් හැඳින්වේ. එම පනත් වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් විය යුතු ය. පනතක් ඊට නිසි ක්‍රියා පිළිවෙළ අනුව සකස් කොට පාර්ලිමේන්තුවේ වැඩි ඡන්ද එකකින්වත් සම්මත වුවහොත් රටේ නීතිය බවට පත් වේ. එය වෙනස් කිරීම, අහෝසි කිරීම වුවද ඒ විදියට ම කළ හැකි ය.

එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනස් කිරීම, අහෝසි කිරීම කළ යුත්තේ විශේෂ බහුතර ඡන්දයකිනි. එනම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට වැඩි ඡන්ද බලයකිනි. ඊට එතරම් වැදගත්කමක් දී ඇත්තේ, අනාගත ආණ්ඩුවක් විසින් ද ස්ථාවර නීතියක් ලෙස පිළිපැදිය යුතු නිසා ය. එසේ ම ආණ්ඩුවක් පවතිද්දීම ආණ්ඩුව වෙනස් වුවත්, ව්‍යවස්ථාව නිසි ක්‍රමයට හැර වෙනස් නොකළ යුතු නිසා ය.

## අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය ඇයි?

අපට 1947 දී පාර්ලිමේන්තු ක්‍රමය සමග අලුත් ව්‍යවස්ථාවක් ලැබිණ.

**1972 දී, බ්‍රිතාන්‍ය බැඳීම්වලින් මිදෙන 'අපේම' යැයි කියැවුණු ජනරජ ව්‍යවස්ථාවක් ලැබිණ.**

**1978 දී ජනාධිපති ක්‍රමයට ගියා වූ ව්‍යවස්ථාවක් ලැබිණ. ඉතින් තවත් අලුත් එකක් අවශ්‍ය ද? ඔව්, ඒ හැම එකක්ම අපට ලැබුණා මිස අප ලබාගත් ව්‍යවස්ථා නොවේ. ඉහළින් තීන්දු කොට පහළට එනම් පොදු ජනතාව මත පැටවුණු ඒවා විය. දැන් අපට වුවමනා පහළින් ඉහළට බලපෑම් කොට ලබා ගන්නා අලුත් ම අලුත් ව්‍යවස්ථාවකි. මක්නිසා ද, අලුත් රටක්, අලුත් මිනිසකු බිහිවීම පොදු ජනතාවගේ අපේක්ෂාව නිසා ය.**

අලුත් එකක් ගැන සිතීමේදී කලින් ව්‍යවස්ථාවන් නිසා ඇති වූ සමාජ, දේශපාලන කැලඹීම් මග හරවා ගැන්මට ඒ ගැන මඳක් විමසා බලමු. 1947 ව්‍යවස්ථාව සහමුලින් ම බ්‍රිතාන්‍යයෙන් ආනයනය කරනු ලැබූවකි. යම් හොඳ ලක්ෂණ තිබුණ ද, යටත් විජිත බැම් එහි යටින් ක්‍රියාත්මක විය. ආර්ථික, අධ්‍යාපනික, භාෂාත්මක වශයෙන් ගැතිවීම එහි මූලික ලක්ෂණ විය. භෞතික වශයෙන්, වරායවල්, ගුවන් තොටුපළවල්, ප්‍රදීපාගාර ඒ වන විටත් පැවතුණේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ ය. තිබුණු ව්‍යවස්ථාව යටතේම 1956 පාර්ලිමේන්තුව මගින් භෞතික වෙනසක් ඇති කළේ ය.

1972 ජනරජ ව්‍යවස්ථාව මගින් විදේශ ගැති ස්වභාවය නැති වී ජාතික ස්වරූපයක් ඇතිවන බවට විශ්වාසයක් තිබිණ. එහෙත් ඒ තුළින් ජාතිවාදී ස්වරූපයක් ඇතිවිය. එම ව්‍යවස්ථාවට පුළුල් ජනතා සංවාදයක් ඇතිවිය. එහෙත් 'සිංහල බෞද්ධ' පටු මතවාදයක් ද ඇතිවිය. සමහර විදේශ බැඳීම් නැතිකරන බව මතුපිටින් පෙනුණත් දේශීය බෙදීම් ඇතිකර ගැනිණ. එතෙක් පැවතුණු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් වූ "කිසිම ජාතියකට හෝ ආගමකට හෝ වැඩි සැලකිල්ලක් හෝ අඩු සැලකිල්ලක් දැක්වීම ව්‍යවස්ථා විරෝධී බව දක්වා තිබුණු 29 වගන්තිය ඉවත් කැරිණ. ඒ වෙනුවට පනවා ගත්තේ ඊට හැම පැත්තෙන් ම පටහැනි වූ නීතියකි. එනම් 1972 ව්‍යවස්ථාවේ 6 සහ 7 ව්‍යවස්ථා දෙකය. එයින් කියැවුණේ "සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බව කියැවෙන පනත පිළිගන්නා බවත්, බුද්ධාගම රාජ්‍යාගම බවත් ය. ප්‍රධාන භාෂා දෙකක්, ප්‍රධාන ආගම් හතරක් පවතින රටක එක් භාෂාවක්, එක් ආගමක් රාජ්‍ය භාෂාව සහ ආගම වශයෙන් ප්‍රකාශ වීම පසුගිය කාලයේ ඇති වූ ගැටුම්, කැලඹීම්, අවි භාවිතයන් ආදියෙහි ආරම්භය විය.

දහස් ගණනක් මරා දැමුණු පසු සිංහල දෙමළ දෙකම රාජ්‍ය භාෂා වුවද එය පොතේ ඇති දෙයක් මිස සැබෑ භාවිතයට නොපැමිණියේ ය. තවමත් එසේ සිදු වී නැත.

**1978 ආ.ක්‍ර. ව්‍යවස්ථාවෙන් පසු නීතිය අවනීතිය විය. පාර්ලිමේන්තුව හොර ගුහාවක් විය. මිනිස්කම අත්හැර, මුදල් පසුපස හඹායන සමාජයක් බිහිවිය. 2010, 18 වැනි සංශෝධනය සමග දුෂ්ට, අධර්මිෂ්ට රාජ්‍ය පාලනය මුදුන් පෙත්තට ම**

**නැග ගති. 2015 ජනවාරි 8 වැනිදායින් පසු 19 වැනි සංශෝධනයත් නිසා අලුත් ගමනකට ප්‍රබල සංඥාවක් ලැබිණ.**

ඉහත සඳහන් සියලු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, එකකුගේ හෝ කීප දෙනකුගේ සිතේ ඇති වී උගතුන් විසින් වාක්‍යගත කළ ඒවා ය. එහෙත් 17 වැනි සංශෝධනයත් (2001), 19 වැනි සංශෝධනයත් යම් ප්‍රමාණයක පුරවැසි කතිකාවන් ඇසුරෙන් බිහිවිය. 17 උපන්ගෙයිම මිය ගියේ ය. 19 සම්මත වූයේ විවිධ කැපුම් කෙටුම් මැද ය. මෙයින් පැහැදිලි වන්නේ 1947 සිට ගොඩ නැගුණු දේශපාලන සත්වයා, ජනතාවගේ හඬට සවන් නොදෙන බව ය. ජනතාවගේ කැමැත්ත ලබාගෙන තමන්ගේ කැමැත්ත පමණක් ඉටු කර ගන්නා බව ය.

ඊනියා දේශපාලන සත්වයා මුළුමනින් පිටු දැකීම අසීරු වුවත් එය කළ යුතු ය. ඒ සඳහා ප්‍රබලම ශක්තිය ඇත්තේ පුරවැසියාට ය. එනම් අපට ය. එය අපේ වර්තමාන යුතුකම ය. ඒ සඳහා අපට අවස්ථාවක් ලැබී ඇත. එය වඩාත් තහවුරු කර ගැනීමට නව ව්‍යවස්ථාවකට අපේ අදහස් පළ කරමු.

**නව ව්‍යවස්ථාවකින් මූලික වශයෙන් සිදුවිය යුත්තේ යහපත් අනාගත පරපුරකට මග පෑදීමෙන් යහපත් මිනිසකු ඇතිවීමේ වටා පිටාව සැලසුම් කිරීම ය. නව මිනිසකු බිහිවීමට අවශ්‍ය කරන නිදහස, ආරක්ෂාව, මානව ගරුත්වය සැලසිය යුතුය. ප්‍රඥාව ඇතිකර ගැනීමට අවශ්‍ය සියලු ඇප උපකාර ලබාදිය යුතු ය. මිනිසාට සහ සොබාදහමට ආදරය කරන මිනිසුන්**

**බිහිවීමට නම් පෝෂණය, රැකවරණය, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ දැනුම සහතික කළ යුතු ය. ඒවා අභිමිවන සෑම මොහොතකම යළි පිහිටුවා ගැනීමේ යුක්තිය තිරසාර විය යුතු ය.**

## පූර්විකාව

**සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකම පූර්විකාවක් ඇත්තේ ය. එහෙත් එහි ලියැවී ඇත්තේ මොනවාද කියා පාලකයන් කිසිවක් නොදැන සිටියා වැනි ය. පූර්විකාව අලංකාරය සඳහා යෙදුණු වචන මාලාවකි. අප පහත සඳහන් පූර්විකාව යොදන්නේ, එම වචන වලින් එසේ යෙදිය යුතු නිසා නොව එම අදහස් සමස්ත ව්‍යවස්ථාවට පදනම් වෙතියි සිතාගෙන ය. සැබැවින් ම ජනතාව මේ ප්‍රතිපත්ති මත පිහිටා සිටිය යුතු ය.**

"ශ්‍රී ලංකාවේ ජනතාව වන අපි, අපේ ජනතාවට අතීතයේ සිදුවූ හා තවමත් සිදුවන අකටයුතුකම් වෙනස්කම් හඳුනා ගනිමු.

ඒ අනුව දිළිඳුකම, යුද්ධය, අයහපත් පාලනය ආදිය නිසා සිදු වූ විපත් තව දුරටත් ඇති නොවීමට වග බලා ගනිමු.

ශ්‍රී ලංකාවේ පවතින වාර්ගික, ආගමික, සංස්කෘතික හා භාෂා වෙනස්කම්, පොදු ශ්‍රී ලාංකීය සංස්කෘතියකට අනිවාර්ය වූ අත්හැරිය නොහැකි කොටස් වශයෙන් පිළිගනිමු.

වෙනස්කොට සැලකීම් හටගැනීම තුරන් කිරීමට යෝග්‍ය වූ ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම, සමාජ සාධාරණත්වය සහ මූලික මානව අයිතිවාසිකම් පදනම් වූ සමාජ ක්‍රමයක් ගොඩ නගමු.

ආණ්ඩුව ජනතාවගේ අනිවාර්ය කැමැත්ත මත පිහිටුවා ගත්තා වූ එකක් විය යුතු අතර එහි සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සියලු පුරවැසියන් නීතියේ සමාන ආරක්ෂාව ලැබිය යුතු බවද පිළිගනිමු.

සියලු පුරවැසියන්ට ගුණාත්මක ජීවිතයක් සහතික විය යුතු අතර එක් එක් පුද්ගලයාගේ හැකියාවන් වර්ධනය කළ යුතු ය.

සියලු රාජ්‍යයන් අතර ශ්‍රී ලංකාව ස්වෛරී ස්වාධීන රාජ්‍යයක් විය යුතු බව පිළිගනිමු.

## පදනම් වූ සාරධර්ම

**සාර ධර්ම ද ඉහත පූර්විකාව මෙන් සැරසිල්ල සඳහා අච්චු අකුරුවලින් තිබුණ ද කවදාවත් භාවිතයට නොගන්නා පරිච්ඡේදයකි. උත්සවයන්හි දී එහි සඳහන් දේ කියනු මිස ජනතාවට එහි සඳහන් ගුණධර්මයක්, නීති ප්‍රතිපත්තියක් අත්**

**විඳින්නට ලැබේද? ඒ ගැන විමසීම පවා සිනාවට කරුණක් විය හැකි ය.**

කෙසේ වෙතත් අපේ හිතේ සැනසීම පිණිසවත් සාරධර්ම කීපයක් අපි සඳහන් කරමු.

ශ්‍රී ලංකාව ඒකීය වූත්, ස්වෛරීවූත්, ප්‍රජාතාන්ත්‍රික ජන රජයකි. පහත සඳහන් සාර ධර්ම සහ ප්‍රතිපත්ති ඊට පදනම් වේ.

අ. සමානත්වයේ ද, මානව අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහසේ ද ප්‍රතිඵලය වූ මානව ගරුත්වය කෙරෙහි කැපවීම.

ආ. ජාතිභේදවාදී, ආගම්භේදවාදී පැවතුම් වලින් තොරවීම සඳහා කිසිම ජාතියක් තවත් ජාතියකට වඩා අඩු හෝ වැඩි සැලකිල්ලකට ලක්වීම සහ කිසිම ආගමක් තවත් ආගමකට වඩා අඩු හෝ වැඩි ගරුත්වයක් ලැබිම වැළැක්වීම.

ඇ. ආ.ක්‍ර. ව්‍යවස්ථාව සහ නීතියේ ආධිපත්‍යය ඉහළම තත්ත්වයෙන් සැලකීම.

ඈ. සර්වජන ඡන්ද බලය, ජාතික ඡන්දදායකයාගේ කාර්ය භාරය, නිසිකලට මැතිවරණ පැවැත්වීම තහවුරු කරන අතර වගකීම, විවෘතභාවය සහ ප්‍රතිචාර දක්වන බව හා අනුකූලතාව සහතික කරන බහු පාක්ෂික ප්‍රජාතාන්ත්‍රීය ආණ්ඩුවක් ඇති කිරීම.

ඉ. ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ අධිශ්‍රේෂ්ටත්වය පිළිගැනීම.

ඊ. ආ.ක්‍ර. ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ජන රජයේ ඉහළම නීතිය වන්නේ ය. ඊට පටහැනි නීති හෝ සංශෝධන පැනවීම අවලංගු විය යුතු ය.

උ. එයින් පනවා ඇති බැඳීම් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු ය.

## මූලික අයිතිවාසිකම්

**මූලික අයිතිවාසිකම් යනු මානව අයිතිවාසිකම් ය. එහෙත් සියලු මානව අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් නොවේ. එනම් තෝරාගත් මානව අයිතිවාසිකම් කීපයක් මූලික අයිතිවාසිකම් ලෙස සඳහන් වේ. එසේ තෝරා ගැනුණු මානව අයිතිවාසිකම් කඩ වුවහොත් නීතියෙන් ඊට ප්‍රතිකර්ම ලබාගත හැකි ය. එහෙත් සමස්ත ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමේ දී සියලු මානව අයිතිවාසිකම් ආරක්ෂාවීම ජනතාවගේ අපේක්ෂාව ය. එම අයිතිවාසිකම් වලින් පිළිබිඹු වන්නේ මානව ගරුත්වය, සමානත්වය සහ නිදහස ය. ඒවා අත්විඳිය හැක්කේ ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම භාවිත වන්නේ නම් පමණි.**

රජය එම මූලික අයිතිවාසිකම්, ගරුකිරීම, ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම සහ සහතික කිරීම කළ යුතු ය.

මෙයින් සමහර අයිතිවාසිකම් වලට නීතියෙන් සාධාරණ සීමා පැනවිය හැකි ය. ඒ ගැන පසුව සඳහන් වේ.

මෙම අයිතිවාසිකම්වල ස්වභාවය අනුව පැවරෙන යුතුකම් හා රාජකාරි ඉටු කිරීමට සියලු රාජ්‍ය නිලධරයෝ බැඳී සිටිති. එහෙයින් ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය සහ රජයේ සියලු ආයතන කෙරෙහි එම බැඳීම ක්‍රියාත්මක විය යුතු ය.

## සමානත්වය

සියලු දෙනා ම නීතිය ඉදිරියේ සමානය කියා ව්‍යවස්ථාවේ තිබුණත් සමහරුන් වැඩියෙන් සමාන බව භාවිතයෙන් පෙනේ. සියලු දෙනාටම නීතියේ සමාන ආරක්ෂාව සහ එහි වාසිය ලැබීමට අයිතිවාසිකම ඇති බැවින් එවැනි භාවිතයක් තිබිය යුතු නැත.

සියලු අයිතිවාසිකම්වල සහ නන් වැදෑරුම් නිදහසේ සමාන හා පූර්ණ භුක්තිය ඇති බව සමානත්වය යන්නෙහි ඇතුළත් වෙයි. සමානත්වය ඉටුකර ගැනීමට යම් ප්‍රතිකර්ම සැලසුම් කළ යුතු ය.

**ජාතිය, සමාජ ලිංගිකත්වය, ලිංගිකත්වය, ගර්භනීභාවය, විවාහක අවිවාහක බව, වාර්ගික හෝ සමාජ ප්‍රභවය, වර්ණය, වයස, අබලතාව, ආගම, ඇදහීම, විශ්වාසය, සංස්කෘතිය, භාෂාව සහ උපත යන**

**කරුණුවලින් එකක් හෝ වැඩි ගණනක් අනුව කිසිම කෙනෙකු අසාධාරණ ලෙස, ඍජු හෝ වක්‍ර වෙනස්කමකට රජය විසින් භාජනය නොකළ යුතු ය.**

ඉහත සඳහන් වෙනස්කම් කිසිම පුද්ගලයකු විසින් අයුතු ලෙස නොකළ යුතු බව ජාතික නීතියෙන් පිළිගත යුතු ය.

## මානව ගරුත්වය

සෑම මිනිසෙකුට ම උපතින් ම ගරුත්වයක් හිමිවන අතර එයට ගරු කරනු ලැබීමට හා එය ආරක්ෂා කරනු ලැබීමට හිමිකම ඇත.

## ජීවිත අයිතිවාසිකම

**සෑම පුද්ගලයෙකුට ම සිය ජීවිතය ආරක්ෂා කර ගැනීමේ අයිතිවාසිකම ඇත. නීතියට පටහැනිව ඊට හානි කිරීමට කිසිම කෙනෙකුට බලයක් නොතිබිය යුතු ය.**

අතුරුදහන් කිරීමේ දී මර්දන නීති යටතේ වෙඩි තැබීමේ දී වධ හිංසා කිරීමේ දී, රට තුළ යුද්ධ කිරීමට තීන්දු කිරීමේ දී ජීවිතයට ඇති අයිතිය ගැන නොසිතීමෙන් සාමාන්‍ය ජනතාවත් එයින් විපාක විඳිති. එය වැළැක්වීමේ තීන්දු ගැනීම ද එම අයිතිවාසිකමට ඇතුළත් විය යුතු ය.

## නිදහස හා පුද්ගල ආරක්ෂාව

සෑම කෙනෙකුටම නිදහසට හා පුද්ගල නිදහසට අයිතිවාසකම සහතික විය යුතු ය. ඊට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

අ. හිතුවක්කාර ලෙස හෝ සාධාරණ හේතුවක් නැතිව එම නිදහස අහිමි කළ නොහැකි විය යුතු ය.

ආ. නඩු විභාගයක් නැතිව අත්අඩංගුවේ තබාගත නොහැකිවිය යුතු ය.

ඇ. රාජ්‍ය හෝ පෞද්ගලික මාර්ගවලින් කවරාකාරයක හෝ වද හිංසාවලින් නිදහස සහතික විය යුතු ය.

ඈ. කවර මාර්ගයකින් හෝ වධ බන්ධන ඇති නොකළ යුතු ය.

ඉ. කුරිරු, අමානුෂික හා පහත් කොට සැලකෙන තත්ත්වයන්ට කිසිවකු යටත් නොකළ යුතු ය.

**හැම කෙනෙකුට ම සිය ශරීරය හා මනස පිළිබඳ ස්වාධීනත්වයට බාධා නොකරනු ලැබීමේ අයිතිවාසිකම සහතික විය යුතු ය.**

අ. දරුවන් ඇති කිරීම හෝ නොකිරීම ගැන තීරණ ගැනීම.

ආ. තම ශරීරය පාලනය හා ආරක්ෂාව

ඇ. වෛද්‍ය හෝ විද්‍යා අත්හදා බැලීම්වලට ගොදුරු නොවී සිටීමේ අයිතිවාසිකම තිබිය යුතු ය.

★ **කිසිම පුද්ගලයකු වහල්භාවයට, දාස භාවයට, බලහත්කාර වැඩ ගැනීම්වලට ගොදුරු නොවිය යුතු ය.**

★ **රහස්‍යභාවය - සෑම කෙනෙකුට ම රහස්‍යභාවය පිළිබඳ අයිතිවාසිකමක් ඇති හෙයින් නීතියට පටහැනිව පහත සඳහන් දේ නොසිදු විය යුතු ය.**

අ. ශරීරය හෝ ගෙදර පරීක්ෂා කිරීම.

ආ. සිය දේපළ පරීක්ෂා කිරීම.

ඇ. සිය සන්තකයේ තිබෙන දේ පැහැර ගැනීම.

ඈ. පණිවුඩ හුවමාරුවලට අවහිර කිරීම.

★ **හැම කෙනෙකුට ම සිය හෘදයසාක්ෂිය, ආගම, චින්තනය විශ්වාසය සහ මතය සම්බන්ධයෙන් නිදහස තිබිය යුතු ය.**

## ප්‍රකාශනයේ නිදහස

**හැම කෙනෙකුට ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇත.**

ඊට පහත සඳහන් කැරුණු ඇතුළත්ය.

අ. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය නිදහස

ආ. තොරතුරු හෝ අදහස් ලබා ගැනීමට හා ලබාදීමට නිදහස

ඇ. කලාත්මක නිර්මාණයේ නිදහස

ඈ. විද්‍යාර්ථී නිදහස සහ විද්‍යා පර්යේෂණ නිදහස

ඉහත සඳහන් නිදහස පහත සඳහන් අවස්ථා දක්වා හිමි නොවේ.

අ. යුද්ධය සඳහා ප්‍රචාරය කිරීම.

ආ. ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹවීම.

ඇ. ජාතිය, ජනවාර්ගිකත්වය, සමාජ ලිංගිකත්වය, ආගම ඇතුළු කරුණු ගැන හානිකර පෙළඹවීම් ඇති කිරීම.

★ **හැම කෙනෙකුට ම සමාකාමීව සහ අවි ආයුධ නැතිව, එක්රැස් වීමට, පෙළපාලි පැවැත්වීමට, පිකට් කිරීමට සහ පෙත්සම් ඉදිරිපත් කිරීමට නිදහස තිබිය යුතු ය.**

★ **හැම කෙනෙකුට ම සංගම් පැවැත්වීමේ නිදහස තිබිය යුතු ය.**

## දේශපාලන අයිතිවාසිකම්

★ සෑම පුරවැසියකුට ම තමන් කැමති දේශපාලනයක් තෝරා ගැනීමේ නිදහස තිබිය යුතු ය. ඊට පහත සඳහන් දේ අයත් වේ.

අ. දේශපාලන පක්ෂයක් හැදීම.

ආ. දේශපාලන පක්ෂයක කටයුතුවලට සහභාගිවීම සහ ඊට සාමාජිකයන් බඳවා ගැනීම.

ඇ. එම දේශපාලන පක්ෂය හෝ මතය වෙනුවෙන් උද්ඝෝෂණයෙහි යෙදීම.

★ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටු වූ ඕනෑම ව්‍යවස්ථාදායක සභාවකට නිදහස්, සාධාරණ හා නියත කාල පරතරයන්හිදී පැවැත්වෙන මැතිවරණ ලබා ගැනීමට සෑම පුරවැසියකුට ම අයිතිවාසිකම ඇත.**

★ **එවැනි මැතිවරණයකදී රහසේ ඡන්දය පාවිච්චි කිරීම හැම වැඩිහිටි පුරවැසියකුට ම අයිතිවාසිකම තිබිය යුතු ය.**

★ **තනතුරු සඳහා ඉදිරිපත් වීමටත්, එය ලැබුණොත් දරා සිටීමටත් නිදහස ඇත.**

★ **කිසිම පුරවැසියකුගේ පුරවැසි බව අහෝසි නොකළ යුතු ය.**

## එහා මෙහා යාමේ සහ වාසය කිරීමේ නිදහස

1. හැම කෙනෙකුට ම රට තුළ එහා මෙහා යාමේ නිදහස ඇත.
2. රටින් බැහැර යාමට හැම කෙනෙකුට ම අයිතිවාසිකම ඇත.
3. ආපසු පැමිණීමට ද, රටේ කැමති තැනක වාසය කිරීමට ද අයිතිවාසිකම ඇත.
4. හැම පුරවැසියකුට ම ගමන් බලපත්‍රයක් ලබාගත හැකි ය.

★ **හැම පුරවැසියකුට ම නීති විරෝධී නොවන, රැකියාවක්, වෘත්තියක් හෝ ව්‍යාපාරයක් කිරීමේ නිදහස තිබිය යුතු ය.**

## සේවක සබඳතා

**හැම කෙනෙකුට ම සාධාරණ සේවා භාවිතයන්ට අයිතිවාසිකම ඇත.**

අ. හැම සේවකයකුට ම වෘත්තීය සමිතියකට බැඳීමටත්, වෘත්තීය සමිති හැදීමටත්

ආ. එම සමිතිවල වැඩසටහන් හා සංවිධාන කටයුතු කිරීමටත්

ඇ. වෘත්තීය සමිතියේ තීරණය පරිදි වැඩ වර්ජනය කිරීමටත් අයිතිවාසිකම ඇත.

සෑම සේවායෝජකයකුටම,

අ. සේවා යෝජකයින්ගේ සංවිධාන පිහිටුවීමටත්

ආ. ඒවා සංවිධාන කිරීමටත් අයිතිවාසිකම ඇත.

සෑම වෘත්තීය සමිතියකටත්, සේවා යෝජකයින්ගේ සංවිධානයකටත්,

අ. සිය කටයුතු පරිපාලනයටත්, සංවිධානය කිරීමටත්, දෙපාර්ශ්වය ඒකාබද්ධව සම්මේලන ගතවීමටත්

ආ. දෙපාර්ශ්වය එකතු වී ගිවිසුම් ඇතිකර ගැනීමට සහ සාමූහික හෙට්ටු කිරීමත්, දෙපාර්ශ්වයේ ආරක්ෂාවත් සලසා ගත හැකි ය.

ඇ. නීතියේ සීමාවන්ට යටත් ව, එම ආරක්ෂක කටයුතු ද, සාමූහික ගිවිසුම් ද ජාතික නීතියෙන් පිළිගත යුතු ය.

## පරිසරය

1. හැම කෙනෙකුට ම, මනා සෞඛ්‍යයට සහ යහ පැවැත්ම සඳහා වූ පරිසරයකට අයිතිවාසිකම ඇත.

2. පරිසරය වර්තමාන හා අනාගත පරපුරේ යහපත සඳහා පැවතිය යුතු ය.

   අ. දූෂණය හා පාරිසරික පරිහානිය වැළැක්වීම.

   ආ. සාධාරණ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා ස්වභාවික සම්පත් භාවිතයත්, තිරසාර පැවැත්මට යෙදීමත් කළ යුතු ය.

## දේපළ

**සියලු දෙනාටම අත්‍යවශ්‍ය දේපළක් හිමිකර ගැනීමේ නිදහස හා පහසුකම තිබිය යුතු ය.**

- හිතුවක්කාර ලෙස කිසිවකුගේ දේපළ අහිමි නොකළ යුතු ය.
- දේපළ භාවිත විය යුත්තේ නීතියට අනුකූලව ය.

- පොදු යහපත පොදු වුවමනාකම් සඳහා ඉඩම් අත්පත් කරගත යුත්තේ උසාවි තීන්දුවකිනි. එවිට සාධාරණ වන්දි ගෙවීමක් කළ යුතු ය.

  ඉඩම් ඇතුළු සියලු ස්වභාවික සම්පත් පොදු අයිතියේ පැවතිය යුතු ය. පාලකයාට තමන් කැමති ලෙස පරිහරණය කිරීම හෝ සන්තකයට ගැනීම හෝ නොකළ හැකි විය යුතු ය.

  අහස, පොළොව, පස, වතුර, වාතය, ඇළ, දොළ, ගංගා, මුහුද, ජලාශ, ගහකොළ, සතා සිවුපාවුන්, කෘමීන් ආදී සියල්ල පොදු දේපළ බව තහවුරු විය යුතු ය. ඒවා පොදු යහපත උදෙසා භාවිත වන ආකාරයට පාර්ලිමේන්තුවෙන් නීති පැනවිය යුතු ය.

## නිවාස

හැම කෙනෙකුටම නිවසක් ඇතිවීම සඳහා අවශ්‍ය නීතිරීති තිබිය යුතු ය.

සාධාරණ අධිකරණ තීන්දුවක් හෝ විකල්ප වාසස්ථානයක් නැතිව කිසිවකුගේ නිවසක් අහිමි නොකළ යුතු ය.

## සෞඛ්‍යය

1. ප්‍රජනන සෞඛ්‍යය ඇතුළු සියලු සෞඛ්‍ය සේවාවන් ලැබීමට, ප්‍රමාණවත් ආහාර සහ වතුර, සමාජ ආරක්ෂණය, (පැවතෙන්නන් ඇතුළුව) ලැබීමට

2. සෑම කෙනෙකුට ම මේවා ලබාදීමට රජය තම සම්පත්වල ප්‍රමාණයට අවශ්‍ය නිසි පියවර ගත යුතු ය.

(සම්පත්වල ප්‍රමාණයට යනු හැමදාම සම්පත් නැති බව කියා වගකීමෙන් ගැළවීමට නොවේ. ඒවා උපදවා ගැන්මේ උත්සාහයන් ගෙන අනතුරුව ඇති ප්‍රමාණයට විය යුතු ය. මේ ගැන දෙන මැතිවරණ පොරොන්දු ඉටු නොවුණොත් ඊට ප්‍රතිකර්ම තිබිය යුතු ය.

3. කිසිවකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර අහිමි නොකළ යුතු ය.

## ළමයි

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් සියලු කරුණු - ළමයින්ගේ අයිතිවාසිකම් ලෙස නීතියෙන් සහතික විය යුතු ය. එම ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව ද අත්සන් කර තිබේ.

## අධ්‍යාපනය

හැම කෙනෙකුට ම මූලික අධ්‍යාපනයට අයිතිවාසිකම ඇත. වැඩිදුර අධ්‍යාපනය ලැබීමට සාධාරණ අවස්ථා තිබිය යුතු අතර එය පහසුවෙන් ලැබිය හැකි විය යුතු ය. (දරුවන්ගේ මූලික අධ්‍යාපනය වැඩිහිටියන්ට බරක් හා කරදරයක් නොවිය යුතු ය.)

හැම කෙනෙකුට ම රාජ්‍ය භාෂාවකින් හෝ ළමයින් තෝරා ගන්නා භාෂාවකින් රජයේ අධ්‍යාපන ආයතනවලින් අධ්‍යාපනය ලැබිය හැකි විය යුතු ය. ඒ සඳහා රජය විසින් නිසි ප්‍රායෝගික ක්‍රියාමාර්ග හා සැලසුම් යෙදිය හැකි ය. එහි දී,

අ. සම සාධාරණත්වය

ආ. ප්‍රායෝගිකත්වය

ඇ. අතීතයේ පටන් තිබූ විෂමතාවලට ප්‍රතිකර්ම යෙදිය යුතු ය.

හැම කෙනෙකුට ම තම වියදමින් ස්වාධීන අධ්‍යාපන ආයතන පිහිටුවීමට සහ එහි අධ්‍යාපනය ලැබීමට අයිතිවාසිකම ආරක්‍ෂා විය යුතු ය. එහි දී,

අ. ජාති, ආගම්, තරාතිරම් අනුව වෙනස්කම් නොතිබිය යුතු ය.

ආ. රජයේ පිළිගත් ඊට අනුගත ආයතන විය යුතු ය.

ඇ. රජයේ ආයතනවලට අධ්‍යාපනයට වඩා තත්ත්වයෙන් පහත් නොවිය යුතුය.

## භාෂාව හා සංස්කෘතිය

හැම කෙනෙකුට ම තමන් තෝරා ගන්නා භාෂාව භාවිතයටත් තමන් කැමති සංස්කෘතික ක්‍රියාකාරකම්වලටත් අයිතිවාසිකම තිබිය යුතු ය.

එම තෝරා ගැනීම් නීතියට පටහැනි නොවිය යුතු ය.

මෙහි දී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන වටාපිටාවක් තිබිය යුතු ය.

## සංස්කෘතික, ආගමික සහ භාෂාමය ජන කොටස්

යම් සංස්කෘතික, ආගමික, භාෂාමය කොටස්වලට අයත් පුද්ගලයන්ට එම ජන කොටසේ සෙසු අය සමග සිය ආගම, භාෂාව භාවිත කිරීම හා සංස්කෘතිය භුක්ති විඳීම අහිමි නොකළ යුතු ය.

එසේ ම එම සංස්කෘතික, ආගමික හා භාෂාමය සංගම් පිහිටුවීමටත්, ඒවාට බැඳීමටත්, සිවිල් සමාජයේ සෙසු සංවිධාන සමග ක්‍රියා කිරීමටත් අයිතිවාසිකම ඇත.

## තොරතුරු ලබා ගැනීම

- හැම කෙනෙකුට ම රජය සතුව තිබෙන ඕනෑම තොරතුරක් ලබා ගැනීම සහ
- අයිතිවාසිකමක් භුක්ති විඳීමට හෝ ආරක්ෂා කිරීමට අවශ්‍ය වන තොරතුරක් වෙනත් පුද්ගලයකු සතුව තිබුණත් එය ලබාගත හැකි විය යුතු ය. එහෙත් අයිතිවාසිකමට පටහැනිව එසේ ලබාගත නො හැකි ය.

## සාධාරණ පරිපාලන සේවයක්

නීත්‍යනුකූල, සාධාරණ, පරිපාලන සේවයක් ලැබීමට හැම පුරවැසියෙකුට ම අයිතිවාසිකම තිබේ.

පරිපාලන ක්‍රියා මගින් අයිතිවාසිකම් කඩ වූ යම් කෙනෙකුට ඊට ලිඛිත හේතු ලබාගත හැකි විය යුතු ය.

අයිතිවාසිකම් සහතික කිරීමට අදාළ නීති සම්පාදනය විය යුතු අතර ඒවා විමර්ශනය කිරීමට අපක්ෂපාත විනිශ්චය මණ්ඩල පැවතිය යුතු ය.

එම අයිතිවාසිකම් ක්‍රියාත්මක වීමට අවශ්‍ය යුතුකම් රජය වෙත නීතියෙන් පැවරී තිබිය යුතු ය. ඒ සඳහා කාර්යක්ෂම පරිපාලන සේවයක් තිබිය යුතු ය.

## උසාවි ප්‍රතිකර්ම

හැම කෙනෙකුට ම තමන්ට ඇති වූ ආරවුලක් සම්බන්ධයෙන් උසාවියකට යොමුවීමෙන් පසු සාධාරණ අපක්ෂපාත හා විවෘත නඩු විභාග යක් ලැබීමේ අයිතිවාසිකම ඇත. එසේ ම සුදුසු අවස්ථාවක දී වෙනත් ස්වාධීන මණ්ඩලයකින් තීන්දුවක් ලබාගත හැකි විය යුතු ය.

## අත්අඩංගුව, රඳවා තැබීම, චූදිත පුද්ගලයෝ

**1. යම් වරදක් කර ඇතැයි අත්අඩංගුවට පත්වන පුද්ගලයන්ට පහත සඳහන් අයිතිවාසිකම් ඇත.**

අ. පිළිතුරු නොදී නිහඬවීම.

ආ. එසේ නිහඬවීමේ අයිතිවාසිකම ඇති බව හා නිහඬව නොසිටීමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල දැනුම් දෙනු ලැබීම.

ඇ. තමන්ට එරෙහිව සාක්ෂියක් වශයෙන් යොදාගත හැකි වරද පිළිගැනීමකට බල නොකිරීම.

ඈ. හැකි ඉක්මණින් නීතියේ පරිදි උසාවියකට ඉදිරිපත් කරනු ලැබීම.

ඉ. අත්අඩංගුවට ගෙන පළමු උසාවි දිනයේ දීම චෝදනා ඉදිරිපත් කිරීම හෝ තවදුරටත් රඳවා තැබීමට හේතු දැක්වීම හෝ නිදහස් කරනු ලැබීම.

ඊ. සාධාරණ හේතු මත උසාවියේ මතය අනුව රඳවා තබනු ලැබීමෙන් නිදහස් කිරීම.

**2. දඬුවම් නියම වූ සිරකරුවා ඇතුළුව රඳවා තිබුණු හැම කෙනෙකුටම, පහත සඳහන් අයිතිවාසිකම් තිබිය යුතු ය.**

අ. රඳවා තබා ගැනීමේ හේතුව වහා දැනුම් දෙනු ලැබීම.

ආ. නීති සේවා ලබාගැනීමේ අයිතිවාසිකම ඇති බව දැනුම දෙනු ලැබීම.

ඇ. රජයේ නීතිඥ සහාය ලැබිය හැකි බව වහා දැනුම් දෙනු ලැබීම.

ඈ. රඳවා තබා ගැනීම නීතියට පටහැනි යැයි සිතන්නේ නම් අධිකරණයට ගොස් නිදහස ලැබීම.

ඉ. රඳවා තබා ගැනීම මනුෂ්‍ය ගරුත්වයට ගැළපෙන පරිදි විය යුතු අතර, රජයේ වියදමෙන්, ඉඩ කඩ, නිසි ආහාර, වෛද්‍ය සේවා සහ පොත් පත් ලබා දීම සහ

ඊ. එම පුද්ගලයාගේ භාර්යාව හෝ පුරුෂයා, ළඟම නෑයා, කැමති ආගමික පුද්ගලයා සහ තමන් කැමති වෛද්‍යවරයා සමග සංනිවේදනයට අවස්ථාව තිබීම.

**3. චෝදනා ලත් හැම පුද්ගලයෙකුට ම සාධාරණ නඩු විභාග යකට සහ පහත සඳහන් අයිතිවාසිකම් ද ඇත.**

අ. තමන්ට එරෙහි චෝදනාවට පිළිතුරු දීමට තරම් සෑහෙන විස්තර ලැබීම.

ආ. සිය ආරක්ෂණය සඳහා සූදානම් වීමට කාලය හා පහසුකම් සලසනු ලැබීම.

ඇ. ප්‍රමාදයක් නැතිව නඩු විභාගය පටන් ගනු ලැබීම හා අවසන් කරනු ලැබීම.

ඉ. නඩු විභාගයට පැමිණීමේ නිදහස

ඊ. තමන් වෙනුවෙන් නීතිඥයකුගේ සේවය ලබා ගත හැකි බව වහා දැනුම් දෙනු ලැබීම.

උ. යම් අගතියක් සිදුවිය හැකි විටක දී රජයේ නීතිඥ සහායක් ලැබිය හැකි බව දැනුම් දෙනු ලැබීම.

ඌ. ඔප්පු වන තුරු නිර්දෝෂී යයි සලකනු ලැබීම, පිළිතුරු නොදී සිටීම, විභාගය අතරතුර දී ප්‍රශ්න නොකරනු ලැබීම.

එ. සාක්ෂි ඉදිරිපත් කිරීම හා අනෙක් සාක්ෂිවලට අභියෝග කිරීම.

ඵ. තමන්ට තේරුම්ගත හැකි භාෂාවකින් නඩු විභාග කරනු ලැබීම හෝ නිසි පරිවර්තනයක් ලැබීමට

ක. වරද කරනු ලැබූ හෝ නොකරනු ලැබූ අවස්ථාවේ දේශීය හෝ අන්තර්ජාතික නීතිය යටතේ වරදක් නොවූ කාරණාවකට වරදකරු නොකරනු ලැබීම.

ග. කලින් වරදකරු කරන ලද හෝ නිදහස් කරන ලද කරුණකට යළි නඩු විභාග නොකරනු ලැබීම.

ච. වරද සිදු වූ අවස්ථාව හා නඩුවෙන් දඬුවම් කරන අවස්ථාව අතර දඬුවමේ වෙනස්කමක් සිදුවූයේ නම්, එහි අඩු දඬුවම නියම කරනු ලැබීමට

ජ. ඉහළ උසාවියකට අභියාචනා කරනු ලැබීම.

**4. මෙම අයිතිවාසිකම් යටතේ යම් තොරතුරක් කෙනෙකුට දිය යුතු විටක දී එය එම පුද්ගලයා දන්නා භාෂාවෙන් දිය යුතු ය.**

**5. මෙම අයිතිවාසිකම් උල්ලංඝණය වන ආකාරයෙන් ලබා ගැනුණු සාක්ෂියක් වෙතොත් නඩු විභාගය අසාධාරණ විය හැකි නිසාත්, පරිපාලන යුක්තියට හානි සිදුවිය හැකි නිසාත් එය බැහැර කළ යුතු ය.**

## අයිතිවාසිකම් සීමා කිරීම

ඉහත සඳහන් අයිතිවාසිකම් සාමාන්‍ය නීති භාවිතයට එකඟව සීමා කළ හැකි ය. එම සීමාවන් මානව ගරුත්වය, සමානත්වය සහ නිදහස පදනම් වූ ප්‍රජාතාන්ත්‍රික සමාජයකට ගැළපේ නම් පමණි. එහි දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.

අ. අයිතිවාසිකමේ ස්වභාවය

ආ. සීමාවක් නැති කිරීමේ වැදගත්කම

ඇ. එම සීමාවේ ස්වභාවය සහ පරිමාණය

ඈ. සීමාවේ සහ එහි පරමාර්ථයේ සම්බන්ධතාව

ඉ. අඩු සීමාවන්ගෙන් පරමාර්ථය ඉටුකර ගැනීම

ඉහත සඳහන් කරුණු අනුව හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථා අනුව හැර වෙනත් නීතියකින් එම අයිතිවාසිකම් සීමා නොකළ යුතු ය.

## විශේෂ අවධානය යොමුවිය යුතු කොටස්

ළමයින් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ගිවසුම්වලට බැඳී ඇති නමුත් තවමත් ඔවුන්ට සැලසෙන ආරක්ෂාව ප්‍රමාණවත් නැත.

ස්ත්‍රීන් හා තරුණයන් පාලන ආයතනවල නිසි ප්‍රමාණයට නියෝජනය වීම ගැන ඇති උත්සාහය තවමත් මන්දගාමී ය.

තවද, වෙනස් හැකියා ඇති අය, සුළුතර ජනයා, කොන් වූ ජන කොටස්, ආදීවාසීන්, වැඩිහිටියන් ආදීන් සම්බන්ධ අන්තර් ජාතික ප්‍රමිතීන්ට එකඟ විය යුතු අතර, ඔවුන්ගෙන් සමාජයට ගත හැකි ප්‍රයෝජන ගැන සැලසුමක් තිබිය යුතු ය.

## හදිසි නීතිය

මෑත අතීතයේ ශ්‍රී ලංකාවේ ඉතා දරුණු මර්දනකාරී පියවර ගැනීමට උපයෝගී වුණේ හදිසි නීතියයි. විටෙක එහි සඳහන් පරමාර්ථ ඉක්මවා ගොස්, පළිගැනීමට හා ඍජු මර්දනයට එය යොදා ගැනිණ. උදා. 1980 මහ වැඩ වර්ජනය. එහිදී රබර් කිරි කැපීම පවා අත්‍යවශ්‍ය සේවාවක් විය.

දැනට මහජන ආරක්ෂක පනත යටතේ විධායකයට පැනවිය හැකි රෙගුලාසි ගැන සීමාවක් තිබිය යුතු ය.

හදිසි නීතිය පැනවිය හැකි කරුණු මෙසේ විය යුතු ය. එනම් : යුද්ධය, ආක්‍රමණය, කැරලි ගැසීම්, කැලඹීම් ඇති කිරීම, ස්වභාවික ආපදාවන්, වෙනත් පොදු හදිසි අවස්ථා.

**හදිසි නීති ප්‍රකාශ කිරීම එම ආපදා අවස්ථාව මග හැරීමට පමණක් විය යුතු ය. හදිසි නීතිය ප්‍රකාශ කොට බලපැවැත්වීමේ කාලසීමාව නියම විය යුතු ය. අවස්ථාවෝචිත පරිදි මාස දෙක තුනකට සීමාවිය යුතු ය. කාලය දීර්ඝ කිරීම පාර්ලිමේන්තුවෙන් කළ යුතු ය. එහෙත් ලංකාවේ සිදු වූයේ ආරක්ෂක ඇමතිවරයාගේ යෝජනාව කිසිම වග විභාගයක් නැතිව සම්මත කිරීම ය. එවැනි පාර්ලිමේන්තුවක් ජනතාවට හිතකර නැත. වැඩි ඡන්ද ගණනකින් සම්මත වුවත් විරුද්ධ අදහස්වලටත් යම් පිළිගැනීමක් තිබිය යුතු ය.**

**ශ්‍රේෂ්ඨාධිකරණයට හදිසි නීතිය පැනවීම, දීර්ඝ කිරීම පිළිබඳ වලංගුතාව ප්‍රශ්න කළ හැකි විය යුතු ය.**

හදිසි නීතිය සමග ගන්නා ක්‍රියා මාර්ග ආදියෙන් අන්තර්ජාතික නීතිවලින් රජය බැඳී ඇති අයිතිවාසිකම් කඩවන්නේ දැයි අධිකරණයට අර්ථ නිරූපනය කළ හැකි විය යුතු ය.

හදිසි නීති සමග අනෙකුත් මර්දන නීති යොදා ගැනීමෙන් අනුල්ලංඝනීය අයිතිවාසිකම් කඩවන්නේ නම් එය ප්‍රශ්න කරනු ලැබීමේ නිදහස ද අහිමි නොවිය යුතු ය. ජීවිතයට ඇති අයිතිය, මානව ගරුත්වය, වධ හිංසා පැමිණවීම කිසිසේත් උල්ලංඝනය කළ නොහැකි විය යුතු ය.

## මානව අයිතිවාසිකම් කොමිසම

**දැනට පවතින මානව හිමිකම් කොමිසමට පනතේ 10 සහ 11 වගන්තිවලින් පුළුල් බලතල පැවරී ඇතත් එහි තීන්දු බලාත්මක නොවීම නිසා අයිතිවාසිකම් උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන වලින් සාධාරණයක් ඉටු නොකළ හැකි තත්ත්වයක් පවතී. එම තත්ත්වය වෙනස්විය යුතු ය.**

පහත සඳහන් ක්‍රියා මාර්ග වඩාත් ප්‍රායෝගික තත්වයට පත්විය යුතු ය.

අ. රටේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම වර්ධනය කිරීමේ ක්‍රියා මාර්ග සහ රට තුළ මානව අයිතිවාසිකම් සංස්කෘතියක් ගොඩ නැගීමේ කටයුතු.

ආ. ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කෙරෙමින් ජාතික සංවර්ධනයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාවේ කරුණක් බවට පත් කිරීම.

අැ. රජයේ සහ පෞද්ගලික ආයතනවල මානව අයිතිවාසිකම් පිළිපැදීම සහ ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම.

අෑ. ජාතික ආරක්ෂක අංශයන් ඇතුළුව රටේ ජන ජීවිතයෙහි මානව අයිතිවාසිකම් පිළිපැදීමේ තත්වයන් ගැන විපරම් කිරීම, විභාග කිරීම සහ වාර්තා කිරීම.

ඉ. මානව අයිතිවාසිකම් (මූලික අයිතිවාසිකම්වලට පමණක් සීමා නොවී) උල්ලංඝනයන් සම්බන්ධ පැමිණිලි බාරගෙන ඊට නිසි ප්‍රතිකර්ම කෙරෙහි යොමු කිරීම.

ඊ. පැමිණිලි ලැබීමේ හෝ කොමිසමේ මැදිහත්වීමෙන් මානව හිමිකම් කඩ කිරීම් ගැන විභාග කොට, පර්යේෂණ කොට අදාළ රාජ්‍ය ආයතනයන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම.

උ. මානව අයිතිවාසිකම් සම්බන්ධ ගිවිසුම් සහ සම්මුතිවලින් ඇතිවන බැඳීම් ගැන ප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

ඌ. කවර හෝ රාජ්‍ය පරිපාලන ආයතනයක යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අනුචිත හෝ අගතිගාමීයයි සැක ඇති වුවහොත් ඒ ගැන පරීක්ෂා කිරීම.

එ. බලය අනිසි ලෙස භාවිතය, අසාධාරණ සැලකීම, පැහැදිලි අයුක්ති සහගත හෝ අනීතික, පීඩාකාරී හා නොතකා හැරීමේ නිලධාරි හැසිරීම් ගැන පැමිණිලි විභාග කිරීම.

ඒ. ඉහත සඳහන් පරීක්ෂා කිරීම් හා විභාග කිරීම් වලින් අනතුරුව ප්‍රතිකර්ම යෙදීමට සැලසීම.

ඔ. නීති මගින් පැවරුණු වෙනත් කාර්යයන් ඉටු කිරීම.

★ **අයිතිවාසිකම් පරිච්ඡේදයේ සඳහන් කවර හෝ අයිතිවාසිකමක් කඩකිරීම, අහිමි කිරීම හෝ එසේ කිරීමට ආසන්නව තිබීම ගැන කොමිසමට පැමිණිලි කිරීමට හැම පුද්ගලයකුටම අයිතිවාසිකම ඇත.**

★ **මෙම අයිතිවාසිකම් බලගැන්වීමේ නීති පනත් පැනවීමට පාර්ලිමේන්තුවට වගකීම පැවරේ.**

## ජනතාව නියෝජනය කිරීම හෙවත් මැතිවරණ ක්‍රමය සහ ක්‍රියාවලිය

**මැතිවරණ ක්‍රමය පහත සඳහන් ප්‍රතිපත්තිවලට එකඟ විය යුතු ය.**

අ. ඉහත සඳහන් වූ පරිදි පුරවැසියන්ට දේශපාලන නිදහස භාවිත කළ හැකි විය යුතු ය.

ආ. මහජන ආයතනවලට තෝරා ගනු ලබන පුද්ගලයන්ගෙන් ස්ත්‍රී හෝ පුරුෂ සාමාජිකයන් 2/3ට නොවැඩි විය යුතු ය.

ඇ. වෙනස් හැකියාවන් ඇති අයට ද නියෝජනයවීමට ඉඩ තිබිය යුතු ය.

ඈ. සාධාරණ නියෝජනය සහ සමානත්වය උදෙසා සර්වජන ඡන්ද බලය යෙදීම.

උ. මැතිවරණ නිදහස් හා සාධාරණ විය යුතු ය.

එනම් රහසිගත ඡන්දය

හිංසාව, බිය ගැන්වීම, අනිසි බලපෑම් සහ දූෂණයෙන් තොර විය යුතු ය.

ස්වාධීන කොමිසමකින් ක්‍රියාත්මක විය යුතු ය.

විනිවිද පෙනෙන බව තිබිය යුතු ය.

එම ක්‍රියාවලිය අපක්ෂපාත, මධ්‍යස්ථ, කාර්යක්ෂම, නිවැරදි හා වගවීම සහිත ආකාරයෙන් පැවැත්විය යුතු ය.

★ මැතිවරණ පැවැත්වීම, ඡන්ද දායකයන් ලියා පදිංචි කිරීම සහ කොට්ඨාස සීමා දැක්වීම සඳහා පාර්ලිමේන්තුව වෙනම නීති රීති පැනවිය යුතු ය.

★ දූනට අත්හැර දමා ඇති, විදේශ රැකියා නියුක්තයන්, බන්ධනාගාර ගත වූවන්, රෝහල්ගත වූවන් ආදීන්ගේ ඡන්ද අයිතිය භාවිත කළ හැකි ක්‍රම සකස් කළ යුතු ය. විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා, ඡන්දය දීමේ පහසු ක්‍රමවේද සැකැසීම සිදුවිය යුතු ය.

★ ඡන්දදායකයන් ලියා පදිංචිය

ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් :

අ. වයස 18 ක් වූ රටවැසියකුවීම.

ආ. මානසික අබලතාවක් ඇතැයි තීන්දු නොකරනු ලැබීම.

ඇ. පසුගිය පස් අවුරුද්ද තුළ මැතිවරණ වරදකට දඬුවම් නොලබා තිබීම.

★ එසේ සුදුසුකම ඇත්තවුන් එක් ස්ථානයක පමණක් ලියා පදිංචි විය යුතු ය.

★ ඡන්ද අපේක්ෂකයෝ

මැතිවරණ කොමිසම විසින් නියම කරන ලද, මැතිවරණ ආචාර ධර්මවලට සියලු අපේක්ෂකයන් සහ දේශපාලන පක්ෂ අවනත විය යුතු ය.

ඕනෑම පුද්ගලයකුට ස්වාධීන අපේක්ෂකයකු ලෙස තරග කළ හැකි ය. එහෙත් මැතිවරණ දිනයට මාස තුනක් ඇතුළත වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය නොතිබූ අයකු විය යුතුය.

## දේශපාලන පක්ෂ

**අ. සෑම දේශපාලන, පක්ෂයක් ම ජාති ආගම් මුල්කොටගත් පරමාර්ථවලින් තොර ජාතික ලක්ෂණයන්ගෙන් යුක්ත විය යුතු බවට පනතකින් නියම කළ යුතු ය.**

ආ. පක්ෂ පාලනය ප්‍රජාතන්ත්‍රවාදී විය යුතු ය.

ඇ. ජාතික සමගිය ප්‍රවර්ධනය කළ යුතු ය.

ඈ. පක්ෂය තුළ යහපාලන ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු අතර නිලවරණ ප්‍රජාතන්ත්‍රවාදී විය යුතු ය.

ඉ. සෑම දෙනකුගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට ගරු කළ යුතු ය. එහිදී සුළුතරයන්ගේ වෙනස් හැකියා ඇති අයගේ අයිතිවාසිකම් ද සැලකිය යුතු ය.

ඊ. මානව අයිතිවාසිකම්, නන් වැදෑරුම් නිදහස, ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සාධාරණත්වයට ගරු කළ යුතු ය.

උ. ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ පරමාර්ථවලට සහ නීතියේ ආධිපත්‍යයට සහාය විය යුතු ය.

ඌ. දේශපාලන පක්ෂවලට නියමිත ආචාර ධර්ම පද්ධතිය වැඩි දියුණු කරමින් පිළිපැදිය යුතු ය.

★ පහත සඳහන් කරුණු සඳහා කිසිම දේශපාලන පක්ෂයක් නොපිහිටුවිය යුතු ය.

අ. ජාතිය, වර්ගය, ආගම, භාෂාව, ස්ත්‍රී හෝ පුරුෂ, ප්‍රදේශ වශයෙන් සීමා කිරීම සහ ඉහත කරුණු එකක්වත් සම්බන්ධයෙන් ද්වේෂය පැතිරවීම.

ආ. එම පක්ෂයේ සාමාජිකයන් හිංසනය කෙරෙහි දිරිගැන්වීම සාමාජිකයන්, සහායවන්නන්, විරුද්ධවාදීන් හෝ වෙනත් අය බිය ගැන්වීම.

ඇ. සන්නද්ධ කණ්ඩායම් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම.

ඈ. අල්ලස් හෝ වෙනස් ආකාර දූෂණයන්හි නොයෙදිය යුතු ය.

උ. නීත්‍යානුකූලව ලැබිය හැකි දේ හැර ඡන්ද ව්‍යාපාර සඳහා පොදු සම්පත් භාවිත කිරීම.

පාර්ලිමේන්තුවෙන් පනවන නීතියක් මගින් එම පක්ෂ වලට රජයේ මාධ්‍යවල සෑහෙන ඉඩ කඩක් සැපයිය යුතු ය.

ඡන්ද ප්‍රචාර කටයුතු නිදහසේ පැවැත්වීම සඳහා ප්‍රමාණවත් අවස්ථා සැපයිය යුතු ය.

දේශපාලන පක්ෂ ක්‍රමවත් කිරීම.

දේශපාලන පක්ෂවල කාර්යභාරය විධිමත් කිරීම.

දේශපාලන පක්ෂ අධීක්ෂණය කිරීම.

දේශපාලන පක්ෂ අරමුදල්, ගිණුම් සොයා බැලීම.

මහජන දේපළ භාවිතයෙන් වැළැක්වීම.

## දේශපාලන පක්ෂ හැරයාම

- මන්ත්‍රීවරයකු වශයෙන් එක් දේශපාලන පක්ෂයකින් තරග කොට පාර්ලිමේන්තුවට පත් වූ පසු වෙනත් දේශපාලන පක්ෂයකට සම්බන්ධ වුවහොත් මන්ත්‍රී ධූරය හැර ගියා සේ සැලකෙන නීතියක් අවශ්‍ය ය.

- අතුරු මැතිවරණයක දී යළි තරග කිරීමට අවස්ථාව සැලසිය හැකි ය.
- අපේ මැතිවරණ නීති රීති අනුව පත් වූ මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තු ධුර කාලය අවසන් වන තුරු ආපසු කැඳවිය නොහැකි ය. පත් කිරීමට මෙන් ම අස් කිරීමටත් මහජනයාට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාවක් තිබිය යුතු ය.

## රාජ්‍ය සේවය

**රාජ්‍ය සේවයේ පැවතිය යුතු ගුණ ධර්ම සහ ප්‍රතිපත්තිවලට පහත සඳහන් කරුණු තිබිය යුතු ය.**

අ. ඉහළ ප්‍රමිතියේ වෘත්තීය ආචාර ධර්ම

ආ. කාර්යක්ෂම, ඵලදායී, අරපිරිමැසුම්දායක සම්පත් භාවිතය

ඇ. සේවා සැපයීමේ දී ප්‍රතිචාර දැක්වීම ඉක්මන්වීම, ඵලදායීවීම, අපක්ෂපාත වීම සහ සාධාරණ වීම

ඈ. ප්‍රතිපත්ති සෑදීමේ දී පොදු ජනතා සහභාගිත්වය ලබා ගැනීම

ඉ. පරිපාලන ක්‍රියා සම්බන්ධයෙන් වගවීම

ඊ. කාලීන, නිවැරදි තොරතුරු ජනතාවට ලබාදීමේ දී විවෘත භාවය පැවතීම

එ. ඉහත ආසන්න කරුණු දෙකට යටත්ව, පත්වීම් හා උසස්වීම් දීමේ දී සුදුසුකම් වලට ප්‍රමුඛතාවය දීම

ඒ. විවිධ ජාති, ආගම් ආදිය නියෝජනය විය යුතු ය.

උ. රාජ්‍ය සේවයේ සෑම මට්ටමකදීම, පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම වැනි අවස්ථාවන්හි දී සමාන අවස්ථා ලබාදීම

## බලය බෙදා හදා ගැනීම

**ඒ සම්බන්ධ පරමාර්ථ සහ ප්‍රතිපත්ති**

අ. බලය භාවිතයේ දී ප්‍රජාතන්ත්‍රවාදී සහ වගවීම් සහිත බව වර්ධනය කිරීම

ආ. විවිධත්වය පිළිගනිමින් ජාතික සමගිය පෝෂණය කිරීම

ඇ. යම් ස්ව-පාලන බලතල පොදු ජනතාවට දීම මගින් ඔවුන්ට බලපාන තීරණ ගැනීමේ දී රාජ්‍ය බලය භාවිතයට හවුල්වීම වර්ධනය කිරීම

ඈ. ජන කොටස්වල කටයුතු ඔවුන් විසින් ම කර ගැනීමේ අයිතිවාසිකම පිළිගැනීම සහ ඔවුන්ගේ සංවර්ධනයට දිරිදීම

උ. සුළුතරයන්ගේ සහ කොන් වූ ජන කොටස්වලත් අයිතිවාසිකම් ආරක්ෂා කොට වැඩි දියුණු කිරීම

ඌ. සමාජ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ රට පුරා ම පහසුවෙන් ලබාගත හැකි සේවාවන් පැවතිය යුතුය.

එ. ජාතික හා ප්‍රාදේශීය සම්පත් සාධාරණ ලෙස බෙදා ගැනීම සහතික විය යුතු ය.

ඒ. රාජ්‍ය ආයතනයන්ගේ සේවාවන් සහ විමධ්‍යගත වීම සැලසිය යුතු ය.

ඔ. බලතල වෙන් කිරීම සහ තුලන හා සංවරණ ක්‍රම වැඩිදියුණු කළ යුතු ය.

ඕ. මෙම රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරමාර්ථ ඉටුකරගැනීමට පළාත් ආණ්ඩු රජයට පූර්ණ සහයෝගය දිය යුතුය.

ක. ජාතික, ආගමික, සංස්කෘතික සමානත්වය ගොඩනැගීමේ රාජ්‍ය ප්‍රතිපත්තිවලට පළාත් ආණ්ඩු ද අනුකූලතාව දැක්විය යුතු ය.

ග. ජාතිභේදවාදී සහ හිංසාකාරී නීති රීති සමග ක්‍රියාකාරීත්වයන්ට එරෙහි වීමට රටේම පොදු ජනතාවට ඇති අයිතිවාසිකමට පළාත් ආණ්ඩු ද සහාය විය යුතු ය.

## ස්වභාවික සම්පත් සහ සංවර්ධනය

සංවර්ධනය යන අදහස යටතේ කැබිනට් මණ්ඩලය, අමාත්‍යවරුන් සහ නිලධරයන් ඔවුන්ගේ හිතේ ඇතිවන 'සංවර්ධනය' නීතියට ගලපාගෙන තීන්දු ගන්නා ස්වරූපයක් ඇත. ස්වභාවික සම්පතක් දුටු පමණින් එය පිටරට ආයෝජකයකුට විකුණා මෙරටට රස්සාවල් කීපයක් ලබාදීම සංවර්ධනය ලෙස ඔවුහු සලකති.

ස්වභාවික සම්පත් ආරක්ෂා කර ගනිමින් සංවර්ධනය සිදු කිරීමේ සැලසුම් තිබිය යුතු ය.

ස්වභාවික සම්පත් යනු මොනවාද?

අ. ඉර එළිය

ආ. මතුපිට සහ භූගත ජලය

ඇ. කැළෑවල්, ජෛව විවිධත්වය, ජාන සම්පත්

ඈ. ගල්කඳු, ඛනිජ ද්‍රව්‍ය, පාෂාණභූත ඉන්ධන ආදිය

උ. සතා සිව්පාවුන් සහ පක්ෂීන්, කෘමීන්, මාළුවන්

## කොමිෂන් සභා

1972 ආ.ක්‍ර. ව්‍යවස්ථාවෙන් එවකට තිබුණු රාජ්‍ය සේවා කොමිසම සතු බලතල ඇමති මණ්ඩලයට පැවරිණි. දැන් 2015 වන විට තිබුණු කොමිෂන් සභා හතකට තවත් හතරක් එකතු කරන්නට සිදුවීම ඓතිහාසික අත්දැකීම නිසා සිදුවූවකි. රාජ්‍ය සේවා කොමිසමේ බලතල දේශපාලකයන්ට පැවරීම නිසා රජයේ පත්වීම්, මාරුකිරීම්, උසස්වීම්, අස්කිරීම් සින්නක්කර ලියාගෙන අන්ත දූෂිත තත්වයට පත්වී තිබිණ. එයින් මුදවා ගැන්මට එම කොමිෂන් සභා 'ස්වාධීන' තත්වයට පත් කිරීම අවශ්‍ය විය. තිබුණු කොමිෂන් සභා මෙසේ ය.

**1. මැතිවරණ කොමිසම**

**2. රාජ්‍ය සේවා කොමිසම**

**3. ජාතික පොලිස් කොමිසම**

4. මානව හිමිකම් කොමිසම

5. අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිසම

6. මූල්‍ය කොමිසම

7. සීමා නීර්ණය කොමිසම

19 වැනි සංශෝධනයෙන් එකතු වූ කොමිෂන් සභා හතරකි.

8. විගණන සේවා කොමිසම

9. ජාතික ප්‍රසම්පාදන කොමිසම

10. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම

11. රාජ්‍ය භාෂා කොමිසම

**නව ව්‍යවස්ථාවක් ඇති කිරීමේදී මේ ස්වාධීන කොමිෂන් සභා අතරට තවත් දෙකක් එකතු කිරීම යෝග්‍ය ය.**

**එනම් : අධ්‍යාපන කොමිසම**

**ජනමාධ්‍ය කොමිසම**

අප රටේ වරින් වර අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් වෙයි. මේ තත්වය තීරණය කළ යුත්තේ ස්වාධීන කොමිසමක් මගිනි. දිය යුතු අධ්‍යාපනයේ ස්වභාවය, ගුරු භූමිකාවේ ගුණාත්මක භාවය ආදිය ගැන ස්වාධීන කොමිසමකින් තීරණය වීම බොහෝ ගැටලුවලට විසඳුම ය.

**දැනට පවතින රජයේ හෝ පෞද්ගලික ජනමාධ්‍ය මගින් සංනිවේදන කරන දේවල්හි අන්තර්ගතය රටට ඔබින, රාජ්‍ය**

**ප්‍රතිපත්තිවලට අනුකූල, ඒවා විය යුතු ය. එසේම ජනමාධ්‍යවලට බලපත්‍ර දීමේ දී සලකා බැලිය යුතු කරුණු ද ස්වාධීන කොමිසමකින් සිදුවිය යුතු ය.**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය වෙනස්විය යුතු ය.

**ඉහත කියැවුණු පරිදි 1972 දී නව ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිසමේ කටයුතු ඇමති මණ්ඩලයට පැවරිණ. එදා සිට එම බලය මන්ත්‍රීවරු ද භාවිත කළහ. ඒ නිසා පත්වීමක්, මාරුවීමක්, උසස්වීමක් ගැනීමට මන්ත්‍රීන් පසු පස යාම ඇරඹිණ. ඊට අමතරව කෙනකුගෙන් දේශපාලන පළිගැනීම උදෙසා මන්ත්‍රී මගින් මාරු කිරීම ද සිදුවිය. මැතිවරණයකින් පසු විපක්ෂ දේශපාලනය කළ බවට සැක ඇති අය තොග පිටින් මාරු කිරීමේ ලැයිස්තු සැකැසිණ. 1972ට පෙරත් එසේ සිදු වූයේ අදාළ ඇමතිවරයාගේ මාර්ගයෙනි. 1972න් පසු එය මන්ත්‍රීවරුන්ට පැවරිණි.**

එසේ අසාධාරණ පත්වීම්, මාරුවීම් ආදිය කරන්නට මන්ත්‍රීන්ට බලය ලැබුණේ ආ.ක්‍ර. ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිසමේ බලතල දේශපාලන අධිකාරයට පැවරීම නිසා ය. එහෙත් ඊට හේතුවක් ඇත.

එනම් රාජ්‍ය සේවය නිලධාරි අධිකාරිත්වය යටතේ පැවතීම නිසා ය. යම් රාජකාරියක් කරවා ගැනීමට, එනම් වැටුප් වර්ධනයක්, වැටුප් සැකැසීමක්, සාධාරණ මාරුවක් වැනි දෙයක් කරවා ගැනීමට කන්තෝරුගානේ ගොස් රස්තියාදු වීමට සේවකයන්ට සිදුවී තිබිණ. සාධාරණයක් ඉටු කර ගැනීම බොහෝ කල්ගත වන වැඩක් විය. සෑම කටයුත්තක් ම 'Red tape' හෙවත් රතු පටියට යට වී ඇතැයි යන ප්‍රකට ව්‍යවහාරයක් ද විය. අදාළ ලියවිල්ල ලිපි ගොනුවක දමා රතු රිබන් පටියකින් බැඳ පසෙක දැමීම ඉන් අදහස් වේ. මේ රතුපටි ක්‍රමය ජනතාවට බලවත් හිරිහැරදායක කරුණක් වූයෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම කටයුතු ඇමති මණ්ඩලයට පැවරිණ. පසුව මන්ත්‍රීන්ටද, ඔවුන්ගේ හිතවතුන්ට ද පැවරී රාජ්‍ය සේවය අන්තයට ම පිරිහිණ.

**එහෙයින් එම කාර්යය ස්වාධීන කොමිසමකට පැවැරීම ඉතා ප්‍රශස්ත ය. එහෙත් එසේ කළ පමණින් ඉක්මන් කාර්යක්ෂම සේවයක් ඉටු වේද? එසේ නොවූ නිසා දේශපාලන අධිකාරියට පැවරීමට සිදුවිය. අවශ්‍ය වන්නේ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවයි. එය ලබා ගැනීමට ව්‍යවස්ථාවෙන් ම යම් ප්‍රතිකර්ම සැලසීම අත්‍යවශ්‍ය ය.**

## රාජ්‍ය පරිපාලනය

දැනට පවතින විශාල සංඛ්‍යාවක් වූ ආයතනවලින් කාර්යක්ෂම සේවාවක් මහජනයාට ලබා දීමට රාජ්‍ය පරිපාලනයෙහි වෙනසක් විය යුතු ය. ඊට අමුතු නීති අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ ඒ සඳහා කැපවීම ය.

දැනට පවතින ආයතන සංඛ්‍යාව කොපමණ ද? එය පහත සඳහන් වේ. (දැනට මේ සංඛ්‍යා වෙනස් වී තිබිය හැකි ය.)

| | |
|---|---|
| පළාත් සභා ගණන | 9 |
| දිසාපතිවරු | 25 |
| ප්‍රාදේශීය ලේකම්වරු | 325 |
| පළාත් පාලන ආයතන | 336 |
| අධිකාරයන් (Authoroties) | 33 |
| මණ්ඩල (Boards) | 36 |
| සංස්ථා (Corporations) | 25 |
| විශ්ව විද්‍යාල - උසස් අධ්‍යාපන ආයතන | 29 |
| නීතිගත නොවූ රජයේ සමාගම් | 130 |
| දෙපාර්තමේන්තු | 89 |

ඉහත සඳහන් ආයතන සියල්ලේම කටයුතු, ඉක්මනින් කාර්යක්ෂමව හා අවංකව සිදු වන්නේ නම් ජන ජීවිතය කොතරම් සාර්ථක විය හැකි ද? ඒ අතර නව කොමිෂන් සභා ආදිය නිසා එම ආයතන සංඛ්‍යාව නිසැකව ම වැඩිවනු ඇත. මේ සියලු ආයතන ප්‍රතිසංවිධානය කිරීම හා සේවාවන් සහතික කිරීමට නව ව්‍යවස්ථාවක ප්‍රතිපාදන තිබිය යුතු ය.

## මූල්‍ය පාලනය

සෑම ආයතනයක ම කටයුතු ඉතා කාර්යක්ෂමව නොසිදුවන්නේ නම් ඊට හේතුව පරිපාලන දුබලතා පමණක්

නොවේ. සමහර විට රජයෙන් එම ආයතන පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සැපයෙන්නේ නැත. උදාහරණයක් ලෙස පළාත් පාලන ආයතන ගනිමු. එම පළාත් පාලන ආයතනයන්ට ලැබිය යුතු නිසි මුදල් නොලැබුණහොත් සිදු වන්නේ කුමක් ද? කැඩුණ පාරවල ගමන් කරන්නට සිදුවේ. නැත්නම් පාරේ එළිය නැතිව රෑ කරුවලේ යාමට සිදුවෙයි. මහජනයාට ඉටුවිය යුතු සේවා සැපයීමට වෙන් කරන මුදල් පවා අඩුවෙන් ලැබෙන අවස්ථා නිසා කරදර විඳින්නේ සාමාන්‍ය ජනතාව ය. සමහර දෙපාර්තමේන්තුවලින් කිසිම මෙහෙවරක් ඉටු නොවී නිකම් පඩි ගෙවීම පමණක් කරන අවස්ථා නැද්ද? එසේ නාස්ති කරන මුදල් කොපමණ ද?

**එහෙයින් මූල්‍ය පාලනය නිසි පරිදි, ස්වාධීන කොමිසමකින් සිදුවිය යුතු ය. පාර්ලිමේන්තුවට පමණක් වගකියන මුළුමණින් ම ස්වාධීන ආයතනයක් වීම. බොහෝවිට අනවශ්‍ය දේට වියදම් කොට අවශ්‍ය දේට වියදම් නොකරන අවස්ථා නැද්ද? එය නිසි කළමනාකරණයකට යොමු කිරීමෙන් නාස්තියද දූෂණයද වළක්වාගත හැකි ය. කරන වියදමේ හැටියට සේවයක් සිදුවනවා ද යන්න ඇගැයීමේ ක්‍රමයක් සෑම ආයතනයකම පැවතීම සඳහා අවශ්‍ය මූලික ප්‍රතිපාදන ව්‍යවස්ථාවෙන්ම පැනවිය යුතු ය. වැඩි වැඩක් සිදු නොවී පවතින ආයතන කොපමණ ඇද්දැයි සංගණනයක් පවත්වා ඊට නිසි ප්‍රතිකර්ම යෙදීම නව රාජ්‍ය පරිපාලනයක් සඳහා අත්‍යවශ්‍ය කරුණකි.**

# මහජන මුදල්

**මහජන මුදල් සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් කෙරෙහි පහත සඳහන් මූලධර්ම යෙදිය යුතු ය.**

අ. මුදල් කටයුතු සම්බන්යෙන් විවෘත භාවය සහ වගකීම් භාරය පැවරී තිබිය යුතු අතර අවශ්‍ය හැම විට ම මහජන සහභාගිත්වය තිබිය යුතු ය.

ආ. මහජන මූල්‍යකරණ ක්‍රමවේදයන් සාධාරණත්ව සමාජයක් වර්ධනය කළ යුතු ය. එනම්,

- බදු බර සාධාරණ ලෙස බෙදී යා යුතු ය.
- ජාතික වශයෙන් ලබා ගන්නා ආදායම් ජාතික හා ප්‍රාදේශීය වශයෙන් සමානව බෙදීයාම සුදුසු ය.
- වියදම් කිරීමේ දී ද රටේ හැම පළාතකකට ම සමාන සංවර්ධනයක් සඳහා එසේ කළ යුතු ය. එහෙත් කොන් වූ ප්‍රදේශ සහ ජන කොටස් සඳහා විශේෂ විධිවිධාන යෙදිය හැකි ය.

ඇ. සම්පත් භාවිත කිරීමේ දීත්, ජනතාවගෙන් මුදල් ණයට ගැනීමේ දීත් එහි වාසි සහ අවාසි වර්තමාන සහ අනාගත පරම්පරා වෙත සාධාරණ ලෙස බෙදී යා යුතු ය.

ඈ. මහජන මුදල් බුද්ධිමත් ව හා වගවීම සහිතව පරිහරණය කළ යුතු ය.

ඉ. මූල්‍ය කළමනාකරණය වගකීම් සහිත විය යුතු ය. එසේ ම ඒ සම්බන්ධ වාර්තාකරණය පැහැදිලි විය යුතු ය.

**1978 දී මෙම ව්‍යවස්ථාවට ඇතුළත් කරගෙන ඇත්තේ හොර රහසේ බව කොල්වින් ආර්. ද සිල්වා මහතා ඒ ගැන උග්‍ර ඒ විවේචනයක යෙදෙමින් පවසා ඇත. එහි මාතෘකාව ම නොමග යවන සුළු ය. එනම්, "අන්තර්ජාතික ගිවිසම් හා සම්මුති" යනුවෙනි. එවිට අපට හැඟී යන්නේ මේ එක්සත් ජාතීන් සමග ඇතිවන සම්මුති හා ගිවිසුම් ය. එහෙත් එය ටිකක් කියවාගෙන යනවිට ඇත්තේ "ශ්‍රී ලංකාව තුළ ආයෝජනය වඩාලීම හෝ ආරක්‍ෂා කිරීම" සඳහා විදේශ රාජ්‍යයක සංස්ථා, සමාගම් සමග ඇතිකර ගන්නා ගිවිසුම් බව ය.**

**එම ගිවිසුම තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත වූ විට රටේ නීතිය බවට පත්වන බව එම ව්‍යවස්ථාවෙන් කියැවේ. එසේ ම එම ගිවිසුමට එරෙහිව කිසිම නීතියක් පැනවීම නොකළ යුතු ය. ඒ ගිවිසුම කඩවන පරිදි කිසිම විධායක හෝ පරිපාලන ක්‍රියාවක් නොකළ යුතු ය. දැන් එම නීතිය අපි කියවා බලමු.**

"157 ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් විදේශ රාජ්‍යයක ආණ්ඩුව අතර එම විදේශ රාජ්‍යයේ හෝ එකී වැසියනගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල සමාගම්වල හෝ වෙනත් සමාගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජනය වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත් යම් ගිවිසුමක් හෝ සම්මුතියක් ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යවශ්‍ය වන්නක් බව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් පක්ෂව ඡන්දය දී සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුමට හෝ සම්මුතියට ශ්‍රී ලංකාව තුළ නීතියේ බලපෑම ඇති අතර රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස හැර, ඒ ගිවිසුමේ හෝ සම්මුතියේ විධි විධාන කඩ කෙරෙන කිසිම ලිඛිත නීතියක් පැනවීම හෝ සෑදීම ද විධායක හෝ පරිපාලන ක්‍රියාවක් කිරීම ද නොකළ යුත්තේ ය."

මෙවැනි ගිවිසුම් ඇතිකර ගන්නේ කුමට ද? ශ්‍රී ලංකාව තුළ විදේශ ආයෝජන යෙදීමෙන් රට සංවර්ධනය කිරීමට බව ආණ්ඩු අපට කියන දෙයයි. එහෙත් මෙසේ ආයෝජනය කර අවුරුදු 20ක් හෝ 30ක් ගත වුවත් එයින් ඇති වූ අමුතු සංවර්ධනය කුමක්දැයි පැහැදිලි කිරීමක් නැත. එහෙත් ටික දෙනකුට 'රැකියා' ලැබී ඇති බව කිව හැකි ය. මේ සංවර්ධනය සඳහා අපේ රටෙන් ලාබෙට ශ්‍රමය මිලට ගැනේ. අපේ ශ්‍රමය අඩු මිලට විකිණීම මේ සංවර්ධනය වශයෙන් හැඳින්වේ. එසේ ශ්‍රමය සූරාකෑම නීතිගත වී ඇත. එවිට සූරාකෑම ආරක්ෂා කිරීමට නීතියෙන් බැඳීසිටී. මේ කිසිම ආයතනයක වෘත්තීය සමිති පැවැත්වීමට අපේ අටේ පවතින නීතිය භාවිත කළ

නොහැකි ය. මක් නිසාද ඊට ඉහළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන හෙයිනි. මෙම ආර්ථික සංවර්ධනය හෙවත් විශේෂ සූරාකෑම පහසු කිරීම උදෙසා මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට හදිසි නීතිය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ අණ පනත් යොදා ගැනිණ. එහෙයින් වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් ගතහොත් එය ව්‍යවස්ථාවට හා මර්දන නීතිවලට එරෙහි වීමකි. එවිට ගිවිසුම ආරක්ෂා කිරීම සඳහා විධායක තීන්දු හෝ පරිපාලන ක්‍රියාමාර්ග ගත හැකි ය. එහෙත් ඊට පටහැනි තීන්දු හෝ ක්‍රියා කළ නොහැකි ය.

මෙයින් ආරක්ෂා වන්නේ අපේ රටේ ශ්‍රමිකයන්ගේ නිදහස ද? විදේශීන්ගේ සූරාකෑමේ නිදහසද? 1978 සිට ඇති කළ එම සංවර්ධනයෙන් අපේ රටේ දිළිඳුකම තුරන් වී තිබේද? කම්කරුවාගේ තත්වය දියුණු වී තිබේද? ගොවිබිම් ගොඩකොට කොංක්‍රීට් වනාන්තර වැවීමෙන් ගොවියාගේ තත්වය දියුණු වී තිබේද?

චීනය, ඉන්දියාව පවා විදේශ ආයෝජනවලට ඉඩ දී තිබේ. එහෙත් මුළුමනින් ශ්‍රමය සූරාකෑමේ, රටේ කම්කරු නීති යටපත් කිරීමේ නිදහස විදේශීන්ට දී තිබේද? මෙසේ පනවාගෙන ඇත්තේ විදේශීන් ආරක්ෂා කිරීමේ ගිවිසුම් ය. ඊට ස්වදේශීන් - කම්කරුවන් විරුද්ධ වුවහොත් වෙඩි තබනු ලැබීමේ ප්‍රතිඥාව ය. එය ජාතික සංවර්ධනය ලෙස හඳුන්වා ඇත. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපති සමයේ මේ නීති උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනිණ. ඊට පසු පැමිණි පාලකයන් එය එතරම් භාවිත නොකළත්, භාවිත කළ හැකිය යන බිය රඳවා ගෙන තිබිණ. දැනට ද තත්වය එසේ ය.

**එහෙයින් මෙවැනි විදේශ වහල්කම නීතිගත කිරීමේ උත්සාහයන්ගෙන් මිදිය යුතු අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ අපේ රටේ මිනිසුන් වහල් කර ගැනීමේ කොන්දේසි වෙනුවට සාධාරණව දෙපාර්ශවයට පිළිගත හැකි ගිවිසුම් ඇතිකරගත හැකි ය.**

**එහෙයින් 157 වැනි ව්‍යවස්ථාවක් අපේ නීතිය ලෙස පැනවීම පොදු ජනතාව අපේක්ෂා නොකරති.**

## මහජන පෙත්සම්

දැනට පෞද්ගලික ප්‍රශ්න ගැන මහජන පෙත්සම් කාරක සභාවට පෙත්සමක් යැවීමේ ඉඩකඩ තවත් පුළුල් හා කාර්යක්ෂම කළ යුතු ය.

**එසේම ජාතික ගැටලු, පොදු යහපත පිණිස වූ යෝජනා හා අදහස් යැවීමට අලුත් පෙත්සම් කාරක සභාවක් ඇති කිරීම ද යෝග්‍ය ය. මහජනයාට සිය අදහස් යැවීමේ හා පිළිගැනීමේ වඩාත් විවෘත ඉඩ කඩක් සැපයෙන්නේ නම් බොහෝ උද්ඝෝෂණ, ආරවුල් අඩුවිය හැකි ය. ඒ සඳහා යම් ප්‍රතිකර්ම යෙදීමේ හැකියාව ද එම කාරක සභාවට හෝ ඒ සඳහා පත් කරනු ලබන ඔම්බුඩ්ස්මන්වරයකුට හැකියාව තිබිය යුතු ය.**

## නීතිය හා භාෂාව

වර්තමාන ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ 23 වැනි ව්‍යවස්ථාව මෙසේ කියයි.

> 23. සියලුම නීති සහ අනුනීති පැනවීම නැතහොත් සෑදීම ද එකී සියලුම නීති සහ අනුනීති පළකිරීම ද, ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිවර්තනයක් ද ඇතිව සිංහල සහ දෙමළ භාෂා දෙකෙන් ම විය යුත්තේ ය."

නීති පැනවීමේ භාෂාව වශයෙන් නීතියේ ම සඳහන් වන්නේ එසේ ය. එහෙත් සිදුවූයේ කුමක් ද? ඉංග්‍රීසියෙන් ලියා පසුව සිංහලෙන් හා දෙමළෙන් පළ කිරීම ය. බොහෝ විට සිංහල දෙමළ පිටපත් සොයා ගැනීම අසීරු ය.

**අලුතෙන් ඇති කරන්නට යන ආ.ක්‍ර. ව්‍යවස්ථාවක් සකස් කරන්නේ කෙසේද? ඉංග්‍රීසියෙන් ලියා පසුව සිංහලයට සහ දෙමළයට පරිවර්තනය කිරීමද? මේ රැවටිල්ල තව දුරටත් සිදුවිය යුතු නැත. ආ.ක්‍ර. ව්‍යවස්ථාව කවුරුන් සඳහා ද? සිංහල හෝ දෙමළ කතා කරන බහුතරයක් සඳහා නම් එය ඔවුන්ගේ භාෂාවලින් සකස් විය යුතු ය. ඉංග්‍රීසියෙන් ලිවීම නිසා වෙනසක් ඇතිවිය නොහැකියයි තර්ක කළ හැකි වුවත් බහුතරයකගේ භාෂාවන්ට ගරු කිරීමක් වශයෙන් එසේ කළ යුතු නැද්ද?**

**භාෂා තුනෙන් ම එකවිට ලියමින් ව්‍යවස්ථාවක් හැදීම අරුම පුදුම දෙයක් නොවිය හැකි ය.**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org

---

ISBN : 978-955-4746-41-1